සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2016 ජූලි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

2016-07-23
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *ප්‍රස්තාර කොළ සපයනු ලැබේ.*

(7) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(8) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන් "ආර්ථික සම්පතක" ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) ස්වභාවධර්මය විසින් දෙන ලද සම්පතකි.

(2) ආවස්ථික පිරිවැයක් ඇති සම්පතකි.

(3) අතිරික්ත සැපයුමක් ඇති සම්පතකි.

(4) රාජ්‍ය අංශය මඟින් පමණක් සැපයිය හැකි සම්පතකි.

**1.2** "හීනවන ආන්තික උපයෝගිතාවය" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද?

(1) පුද්ගලයෙකු, දෙන ලද භාණ්ඩයක් වැඩි වැඩියෙන් පරිභෝජනය කරන විට, එම භාණ්ඩයේ ආන්තික උපයෝගිතාවය ක්‍රමයෙන් අඩු වේ.

(2) පුද්ගලයෙකු, දෙන ලද භාණ්ඩයක් වැඩි වැඩියෙන් පරිභෝජනය කරන විට, අනෙකුත් භාණ්ඩවල ආන්තික උපයෝගිතාවය ක්‍රමයෙන් අඩු වේ.

(3) පුද්ගලයෙකු, දෙන ලද භාණ්ඩයක් වැඩි වැඩියෙන් පරිභෝජනය කරන විට, එම භාණ්ඩයේ මුළු උපයෝගිතාවය නොවෙනස්ව පවතී.

(4) පුද්ගලයෙකු, දෙන ලද භාණ්ඩයක් අඩුවෙන් පරිභෝජනය කරන විට, එම භාණ්ඩයේ ආන්තික උපයෝගිතාවය ක්‍රමයෙන් අඩු වේ.

**1.3** යම්කිසි භාණ්ඩයක මිල රු.16/- සිට රු.20/- ට වැඩිවන විට, එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 80 සිට ඒකක 60 දක්වා පහත වැටේ. මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය වන්නේ:

(1) 0.75 (2) 1.0 (3) 0.8 (4) 1.25

**1.4** මූලික ආර්ථික ප්‍රශ්න ඇතිවන්නේ:

(1) ආදායම වැඩිවීම සමග පරිභෝජනය වැඩිවීම නිසාය.

(2) ආර්ථික සම්පත් මාරුකළ නොහැකි වීම නිසාය.

(3) සියලු වුවමනා සපුරා ගැනීමට සම්පත් ප්‍රමාණවත් නොවන නිසාය.

(4) ඉහත සඳහන් සියල්ලම නිසාය.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, වක්‍රබදු වල අවාසියක් වන්නේ කුමක් ද?

(1) බදු ගෙවන්නා විසින් බදු බර දරා සිටීම. (2) එකතු කිරීම රජයට පහසුවීම.

(3) බදුබර බෙදීයාමේ විෂමතාවයක් පැවතීම. (4) බද්ද පැහැරහැරිය නොහැකි වීම.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි කාර්යයක් **නොවන්නේ** කුමක් ද?

(1) ආර්ථික සහ මිල ස්ථායීතාවය. (2) රාජ්‍ය ණය කළමනාකරණය කිරීම.

(3) විදේශ විනිමය කළමනාකරණය කිරීම. (4) මහජනයාගෙන් තැන්පතු බාර ගැනීම.

**1.7** 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, 2015 වර්ෂයේ ශ්‍රී ලංකාවෙහි ආර්ථික වර්ධන අනුපාතිකය වූයේ:

(1) 8% කි. (2) 7.5% කි. (3) 6.2% කි. (4) 4.8% කි.

**1.8** දළ ජාතික ආදායම ගණනය කරනු ලබන්නේ:

(1) දළ දේශීය ආදායම + විදේශ ශුද්ධ සාධක ආදායම.

(2) දළ දේශීය ආදායම + සහනාධාර - ආදායම් බදු - නොබෙදූ ව්‍යාපාර ලාභ.

(3) පුද්ගල ආදායම + ආදායම් බදු + නොබෙදූ ව්‍යාපාර ලාභ.

(4) සාධක ආදායම - සහනාධාර + ආදායම් බදු + ඉතිරිකිරීම්.

1.9 "විවෘත ආර්ථිකයක්" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද?

(1) ලෝකයේ වෙනත් රටවල් සමග අන්‍යෝන්‍යව ක්‍රියානොකරන ආර්ථිකයකි.

(2) ලෝකයේ වෙනත් රටවල් සමග අන්‍යෝන්‍යව ක්‍රියාකරන ආර්ථිකයකි.

(3) රජය ආනයනවලට සීමාකිරීම් පනවා ඇති, නමුත් අපනයන වලට සීමාකිරීම් පනවා නොමැති ආර්ථිකයකි.

(4) වෙළෙඳපොළට නැඹුරු (market-orientation) නොවූ ආර්ථිකයකි.

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ප්‍රතිපත්තියෙහි ගුණාත්මක පාලනයක් වන්නේ කුමක් ද?

(1) ශිෂ්ඨ ප්‍රයෝග (Moral Suasion). (2) විවෘත වෙළෙඳපොළ කටයුතු.

(3) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය. (4) බැංකු අනුපාත ප්‍රතිපත්තිය.

*ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 පූර්ණ තරඟයේදී, භාණ්ඩයකට සිටින්නේ එක් සැපයුම්කරුවෙකි.

1.12 සාමාන්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයේදී, ආන්තික පිරිවැය [Marginal Cost (MC)] වක්‍රය, සාමාන්‍ය පිරිවැය [Average Cost (AC)] වක්‍රය ඡේදනය කරයි.

1.13 වැඩෙන පරිමාණානුකූල ඵල යනුවෙන් අදහස් වන්නේ, සියලුම නිෂ්පාදන සාධක දෙන ලද අනුපාතයකින් වැඩි කරන විට නිපදවන ලද නිමැවුම එම අනුපාතයෙන්ම ඉහළ යන බවයි.

1.14 මූල්‍ය අතරමැදියෙකු යනු මුදල් ණයට දෙන්නන්ගෙන් දෙන ලද පොලී අනුපාතිකයකට තැන්පතු ලබාගෙන ණයට ලබාගන්නන් හට එය වැඩි පොලී අනුපාතිකයකට ණයට දෙමින් ණය දෙන්නන් සමග ණය ලබා ගන්නන් සම්බන්ධ කරනු ලබන ආයතනයකි.

1.15 ආයතනයක පිරිවැය තුළ ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය නමින් ප්‍රධාන වශයෙන් පිරිවැය කොටස් දෙකක් ඇතුලත් වේ.

*ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරා ගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

1.16 ඉල්ලුම් වක්‍රය නොවෙනස්ව තිබියදී, භාණ්ඩයේ සැපයුම් වක්‍රය වමට විතැන් වුවහොත්, භාණ්ඩයේ සමතුලිත මිල …………………… *(වැඩි වේ / අඩු වේ).*

1.17 භාණ්ඩ සහ සේවා වල මිලගණන් වැඩිවූ විට, මුදලේ අගය …………………… *(ඉහළ යයි / පහළ යයි).*

1.18 දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)] තක්සේරු කිරීමට අදාල වර්ෂයේ වෙළෙඳපොල මිල භාවිත කලවිට, එය …………………… *[නාමික (Nominal) දළ දේශීය නිෂ්පාදිතය / මූර්ත (Real) දළ දේශීය නිෂ්පාදිතය]* ලෙස හඳුන්වනු ලැබේ.

1.19 …………………… *[පටු මුදල් සැපයුම ($M_1$) / මූල්‍ය පදනම] ලෙස හඳුන්වන්නේ මහජනයා සතුව පවතින ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකුවල තිබෙන මහජනයා සතු ඉල්ලුම් තැන්පතුවල එකතුවයි.*

1.20 …………………… *[පුළුල් මුදල් ගුණකය / පුළුල් මුදල් සැපයුම ($M_2$)]* ලෙස හඳුන්වන්නේ පටු මුදල් සැපයුම *සහ වාණිජ බැංකුවල තිබෙන මහජනයා සතු කාලීන සහ ඉතුරුම් තැන්පතුවල එකතුවයි.*

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) (i) ශ්‍රී ලංකාවේ ඔබ දකින ආර්ථික ක්‍රමය (Economic system) **සඳහන් කරන්න**. (ලකුණු 01)

(ii) ඉහත (i) පරිදි එබඳු ආර්ථික ක්‍රමයක් තිබීමට හේතු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න (basic economic problems) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)
(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) (i) "සමස්ථ රාජ්‍ය අයවැය හිඟය" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(ii) රාජ්‍ය අයවැය හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රභවයන් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) රාජ්‍ය ව්‍යවසායයන්හි වාසි හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

(a) මුදලේ කාර්යයන් තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යයන් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

### 05 වන ප්‍රශ්නය

(a) අන්තර්ජාතික වෙළෙඳාමට අදාලව "වෙළෙඳ අනුපාතය" (Terms of Trade) යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) (i) "ආර්ථික වර්ධනය" (Economic Growth) යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(ii) ආර්ථික වර්ධනයේ වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

(A) ව්‍යාපාර ලෝකයේ ආයතන විවිධ වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ ක්‍රියාත්මක වන නිසා විවිධ වර්ගයේ වෙළෙඳපොළ ව්‍යුහයන් බිහිවේ. විවිධ වෙළෙඳපොළ ව්‍යුහයන් පවතින අතර ඒ සෑම එකක්ම අනෙකුත් ව්‍යුහයන්ගෙන් වෙන්කොට හඳුනාගත හැකි පරිදි ඒ එක් එක් ව්‍යුහයට නිශ්චිත ලක්ෂණ තිබේ.

පූර්ණ තරඟය, ඒකාධිකාරය, ඒකාධිකාරී තරඟය සහ කතිපයාධිකාරය වශයෙන් ප්‍රධාන වෙළෙඳපොළ ව්‍යුහයන් හතරක් ආර්ථිකයක දැක ගත හැකිය.

(a) ඒකාධිකාරයේ ප්‍රධාන ලක්ෂණ පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(b) ඒකාධිකාරී ආයතනයක් කෙටි කාලයේදී එහි ලාභය උපරිම කරගන්නේ කෙසේදැයි, ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(B) (a) දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)] සහ දළ ජාතික නිෂ්පාදිතය [Gross National Product (GNP)] අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාලව වර්ෂයක කාල සීමාවක් සඳහා අදාල උපකල්පිත දත්ත පහත සඳහන් වගුවෙන් පෙන්නුම් කරයි:

| | | **රු. මිලියන** |
|---|---|---|
| (1) | සේවා නියුක්ති ආදායම | 360,000 |
| (2) | බදු කුලී ආදායම | 220,500 |
| (3) | ස්වයංරැකියා ආදායම | 190,500 |
| (4) | ව්‍යාපාරික අංශය ඉපැයූ ලාභය | 210,600 |
| (5) | පොලී ආදායම | 162,000 |
| (6) | ප්‍රාග්ධන ක්ෂයවීම | 130,600 |
| (7) | සහනාධාර | 100,500 |
| (8) | වක්‍ර බදු | 120,300 |
| (9) | විදේශීය ශුද්ධ සාධක ආදායම | (94,000) |

වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය [Gross National Product (GNP)] **ගණනය කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |